**සිංහල පරිවර්තනය**

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - *2020*

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු **65** ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2021 ජනවාරි මස යාපනයේදී** පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය *18.12.2020* වේ.

| තනතුරේ නම | තනතුරු අංකය | පුරප්පාඩු |
|---|---|---|
| සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය *-2020* | *01* | *65* |
| සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය *-2020* | *02* | |

## *02* බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

*02.1* උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද සත්ව සංවර්ධන උපදේශක සේවයේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කර ඇති කොන්දේසීන්, එහි සංශෝධනයන්ට එකඟවද, ආයතන සංග්‍රහයේ විධිවිධානය ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 හා 2013.07.03 වන දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය ද යනාදීන්ට අනුකූලව තෝරා ගනු ලබන විභාග අපේක්ෂකයන් එම තනතුරේ **III වන ශ්‍රේණියට හෝ පුහුණු ශ්‍රේණියට** පත් කිරීමට නියමිතව ඇත.

*02.2* විවෘත තරඟ විභාගය මඟින් පත්වීම සඳහා තේරීපත් වූ විභාග අපේක්ෂකයන් පත් කරන ලද දින සිට වසර තුනක කාල සීමාවක් සඳහා පරිවාස කාලයට යටත් කොට III වන ශ්‍රේණියේ තනතුරටය පත් කරනු ලැබේ. තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර 03 ක කාල සීමාව තුළ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම අනිවාර්ය වේ.

*02.3* මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයක් වන අතර මෙම පත්වීමට තෝරාපත් කරගනු ලබන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන නියෝගයට යටත් විය යුතුයි.

*02.4* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *01/2014* හා එයට අනුකූලව වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛයන් ප්‍රකාර පත්වීම් දින සිට වසර 05 ක් අවසන් වීමට පෙර නියම කරන ලද දෙවන රාජ්‍ය භාෂාවට ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

*02.5* පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## *03* වැටුප් පරිමාණය :-

### *03.1* සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියට :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *03/2016* ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MN 3- 2016** ප්‍රකාර සත්ව නිෂ්පාදන සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියට ශුද්ධ වැටුප් ප්‍රතිශතය වනුයෙ රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/- කි**. (රුපියල් *32,375* යන වැටුප් පියවරට ප්‍රථම 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛය ප්‍රකාර එහි **උපලේඛන - II** හි සඳහන් විධිවිධානයන්ට අනුව වැටුප් ගෙවනු ලැබේ.

### *03.2* සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණියට :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *03/2016* ප්‍රකාර, චක්‍රලේඛයේ **උපලේඛන V** හි සඳහන් විධිවිධානයන්ට අනුව මාසික වැටුප් හා ගැලපුම් දීමනා ගෙවනු ලැබේ.

*1* වන වර්ෂයේ - රුපියල් *27,140.00*
*2* වන වර්ෂයේ - රුපියල් *27,440.00*

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

*04.1* අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

*04.2* අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදයෙන් අවම වශයෙන් වසර තුනක්වත් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවකු විය යුතුයි.

**හෝ**

අයදුම්කරු හෝ දෙමාපියන්ගේ උපත් ස්ථානය උතුරු පළාත විය යුතුයි
අවම වශයෙන් වසර පහත් වත් *(05)* උතුරු පළාතේ පදිංචි වී සිටි අය විය යුතුයි.
**(*සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද නාම ලේඛණයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි)**

*04.3* අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවක කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික නිරෝගිතාවයකින් යුත් පුද්ගලයකු විය යුතුයි එමෙන්ම මනා චරිතයක් හෙබි පුද්ගලයකු ද විය යුතුයි.

*04.4* අයදුම්කරු විසින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට (18.12.2020) හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවා ඇති **සියළුම සුදුසුකම්** සම්පූර්ණ කර තිබිය යුතුයි.

*04.5* අයදුම්කරුවකු අයදුම්පත භාරගන්නා අවසාන දිනට*(18.12.2020)* වයස **අවුරුදු 18 ට නොඅඩු, 30 නොවැඩි** විය යුතුයි.

## *05* අධ්‍යාපන සුදුසුකම් :-

### 05.1 සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණියට අයත් සුදුසුකම් :-

අ.පො.ස(සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) ගණිතය හා විද්‍යාව යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) විශිෂ්ඨ සාමාර්ථයන් ද සමඟ විෂයයන් හයක්(06) සමත්වී සිටිය යුතුයි.

**ඒ සමඟ**

අ.පො.ස(උ/පෙ) විභාගයෙන් ජීවවිද්‍යාව, රසායනික විද්‍යාව, කෘෂිකර්මය, භෞතික විද්‍යාව, ජීවන පද්ධති තාක්ෂණය හා තාක්ෂණවේද විද්‍යාව යන විෂයයන් ගෙන් විෂයයන් දෙකක් (02) ක් ඇතුළුව විෂයයන් තුනක් (03) **එකවර** සමත්වී සිටිය යුතුයි.
(පැරණි නිර්දේශය නම් විෂයයන් තුනක් (03)ක් සමත්වී තිබිය යුතුයි)

### 05.2 සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියට අයත් සුදුසුකම් :-

ඉහත **ජේද *05.1*** හි සඳහන් කර ඇති සුදුසුකම් වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් කුමක් හෝ සුදුසුකමක් හිමි කර තිබිය යුතුයි.

*01.* අනුරාධපුරය, කුණ්ඩසාලෙයි යන සත්ව පරිපාලන පුහුණු පාසල් වලින් හෝ සත්ව පාලන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් පුහුණු පාසලකින් හෝ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් පුහුණු පාසල්වලින් ලබාගත් **"සත්ව පාලනය"**(Animal Husbandry) සම්බන්ධයෙන් වසර දෙකක පාඨමාලා ඩිප්ලෝමා සහතිකයක් තිබිය යුතුයි.

**හෝ**

02. ශ්‍රී ලංකාවේ කුමක් හෝ පළාතක සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ පුහුණු ආයතනයකින් **"සත්ව පාලනය"**(Animal Husbandry) සම්බන්ධයෙන් වසර දෙකක පාඨමාලා ඩිප්ලෝමා සහතිකයක් තිබිය යුතුයි

**හෝ**

*03.* තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද **"සත්ව පාලනය"**(Animal Husbandry) සම්බන්ධ වසර දෙකක පාඨමාලා ඩිප්ලෝමා සහතිකයක් හෝ **"සත්ව පාලනය"**(Animal Husbandry) යන විෂය නිර්දේශය අන්තර්ගතවූ ජාතික වෘත්තීය පුහුණු **සුදුසුකම් මට්ටම 6 (NVQ 06)** හෝ ඊට ඉහළ මට්ටම සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

**04.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද **"සත්ව පාලන"**(Animal Husbandry) හා සම්බන්ධ උපාධිය හෝ ජාතික වෘත්තීය පුහුණු **සුදුසුකම් මට්ටම 6 (NVQ 06)** මට්ටමට නොඅඩු **"සත්ව පාලනය"**(Animal Husbandry) සම්බන්ධ පාඨමාලාව අන්තර්ගතවූ උපාධිය හිමිවී තිබිය යුතුයි.

## *06* බඳවා ගැනීමේ ක්‍රමවේදය :-

*06.1* ලිඛිත විභාගයක් මඟින් කුසලතාව පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගැන්වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මඟින් කැඳවන ලද සියළු සුදුසුකම් හා ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. මෙහි දී ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ අවශ්‍ය සුදුසුකම් නැති බවට නිරීක්ෂණය වන අවස්ථාවක දී මෙම තනතුර සඳහා හිමි අයිතීන් සියල්ල අහෝසි කරනු ලැබේ.

*06.2* සත්ව සංවර්ධන උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට, බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති විභාග අපේක්ෂකයන් අතුරින් අවශ්‍ය ප්‍රමාණයේ අයදුම්පත් නොලැබුණු අවස්ථාවක දී පමණක් නිවේදනයේ **ඡේද *05.1* හි** කැඳවා ඇති සුදුසුකම් සපුරා ඇති විභාග අපේක්ෂකයන් **සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

*06.3* තීරණය කරන ලද දිනය වන විට සත්ව සංවර්ධන උපදේශක තනතුරේ පවතින පුරප්පාඩුවලින් උපරිම වශයෙන් 60% ක පුරප්පාඩු **ඡේද *05.1* හි** සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් මඟින් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

*06.4* සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා අපේක්ෂකයන් පුහුණු ශ්‍රේණියට පත්කර ගනු ලැබේ (අන්තර්ග්‍රහණය කරනු ලැබේ) සත්ව පරිපාලනයේ **(ඡේද *05.02* හි** සඳහන් ආයතන වල**)** ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මකව පවතින සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව සත්ව පාලන උපදේශක III වන ශ්‍රේණියට පත් කර ගනු ලැබේ.

*06.5* ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන්, තමන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයෙන් ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා පත්වීම සඳහා තෝරාගනු ලැබේ.

*06.6* පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතාවයන් (ආබාධිත) ඇති අපේක්ෂකයන් සඳහා වෙන්කරනු ලැබේ. විභාග අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරාපත් කරගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතාවය (Disability) බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණ වාර්තා මඟින් සනාථ කළ යුතුය.

## *07* විභාග ගාස්තු :-

අයදුම්කරුවන් තමන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් වටිනා මුදල **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන තැන්පත් ගිණුමට තැන්පත් කර එම කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවීම් කරනු නොලැබේ එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයන් සඳහා මාරු කර ගැනීමට අනුමත කරනු නොලැබෙ.

## *08* අයදුම්කරන ක්‍රමවේදය:-

*08.1* මෙම දැන්වීම මඟින් දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (සෙ.මී21 x 29සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා වූ ඡේද පළමු පිටුවේද අනෙක් කොටස් දෙවන පිටුවේ අඩංගුවන පරිදි අයදුම්පත්‍රය සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **18.12.2020** වන දිනට හෝ ඊට ප්‍රථම, "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක :393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි

08.2 අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"සත්ව සංවර්ධන උපදේශක පුහුණු ශ්‍රේණිය / III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2020"** යනුවෙන් සඳහන් කළ යුතුයි

08.3 අයදුම්පත්‍රයේ ඡායා පිටපත තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදිය පිළිගන්නේ නැති අතර විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් යථා කාලයේදී එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මගින් අයදුම්කරු අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි.

08.4 අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් විභාග දිනට අවම වශයෙන් දින 03 කට ප්‍රථම ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ බව දන්වා පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට පියවරගත යුතුයි.( දුරකථන අංකය –021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**දැනුම් දෙන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු:-**
**ආවරණ ලිපියක්, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, විභාග ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.**

## 09 අනන්‍යතාවය ඔප්පු කිරීම :

විභාග අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත දක්වා ඇති ලියකියවිලිවලින් කුමක් හෝ එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විභාගයට පෙනී සිටීමේ හිමිකම අහිමි කිරීමේ බලය **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,"** විසින් තම අභිමතය පරිදි සිදු කළ හැකි හිමිකම ඇත. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නියම කරන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලාගත යුතුයි. මෙම විභාගයේ නීතිරීති වලට එකඟව කිසියම් අයදුම්කරුවකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගය අවසන් වූ පසුව හෝ සුදුසුකම් නැති අයකු බවට තහවුරු වුවහොත් ඔහුට හිමි විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරුවකු සපයා ඇති කුමක් හෝ තොරතුරක් අසත්‍ය බවට පත්වීම් ලබා දීමෙන් පසු තහවුරු වුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පියවර ගනු ලැබේ.

## 11 විෂය මාලාව :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් ගෙන් පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්නපත්‍ර | විෂය නිර්දේශය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක හැකියාව විශ්ලේෂණ ක්‍රමය හා බැඳි හැකියාව තීරණය කිරීමේ හැකියාව යනාදිය සමඟ සංඛ්‍යා, භාෂා හා හැඩ ව්‍යුහය යන කරුණු කෙරෙහි විභාග අපේක්ෂකයාගේ හැකියා මට්ටම මැනීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02 | විෂය හා සබැඳි තාක්ෂණවේදී පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ නව නිපැයුම් කෙරෙහි ඇති අදහස් හ ෘසත්ව නිෂ්පාදන සම්බන්ධයෙන් පැන නගින ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව උරගා බැලීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය ලිඛිත පරීක්ෂණයක් වන බැවින් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා වෙන් කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක ප්‍රතිශතයක් (40%) විභාග අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් කුසලතා අනුපිළිවෙළ(Merit Order) සැළකිල්ලට ගනු ලැබේ.

***12.*** **විභාග ප්‍රතිඵල** :-

විභාග අපේක්ෂකයන් සඳහා විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභා අන්තර්ජාලය මඟින් නිකුත් කරනු ලැබේ. පසුව විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් සියල්ලන්ටම තැපැල් මඟින් යොමු කරනු ලැබේ.

***13.*** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුය. මෙම නිවේදනයේ දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නඟින අවස්ථාවක දී දෙමළ මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.

***18.11.2020***